# කන්‍යා මරිය රාජේශ්වරිය
## මංගල්‍යය

## පළමුවන දේව ප්‍රකාශනය යෙසායා 9: 2–7

*යෙසායා දිවැසිවරයාගේ පොතෙන් උපටා ගත් කොටසකි.*

"එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන්නේ ය."

"අන්ධකාරයෙහි ඇවිද්ද සෙනඟ මහත් ආලෝකයක් දුටුවෝ ය, ගන'දුරු දේශයෙහි විසූ අය කෙරෙහි එළියක් දැන් බැබළෙන්නේ ය. ඉමහත් ප්‍රීතියක් ඔබ ඔවුන්ට දුන් සේක: ඔවුන්ගේ ප්‍රීති ප්‍රමෝදය වර්ධනය කළ සේක. අස්වැන්න කපන කාලයෙහි සෙනඟ කොල්ලය බෙදා ගන්නා කල ප්‍රීති වන්නාක් මෙන් ඔබ ඉදිරියෙහි ඔව්හු ප්‍රීති ප්‍රමෝද වෙති. මන්ද යත්, ඔවුනට බරක් වූ වියගහ ද කර මත තැබූ වියදණ්ඩ ද ඔබ කඩාදැමූ සේක. පෙර කලක ඔබ මිදියන් හමුදා පරාජය කළාක් මෙන් ඔවුන්ට පීඩා කළ ජාතිය ඔබ විසින් පරාජය කරනු ලැබී ය. ආක්‍රමණය කරන හමුදාවේ පාවහන් ද ලෙයින් තැවරුණු ඔවුන්ගේ ඇඳුම් සියල්ල ද ගින්නෙන් දවාලනු ලැබේ.

අපට ළදරුවෙක් උපන්නේ ය: අපට පුත්‍රයෙක් දෙන ලද්දේ ය: එතුමාණෝ අපේ රජු වන සේක. 'එතුමාණෝ, අසිරිමත් උපදේශකයාණෝ ය: ප්‍රතාපවත් දෙවිතුමාණෝ ය: සදාතන පියාණෝ ය: සාමයේ කුමාරයාණෝ ය'යි කියනු ලබන සේක. එතුමන්ගේ රාජ බලය වැඩි වර්ධනය වන්නේ ය: එම රාජ්‍යයේ සාමයට කෙළවරක් නොවන්නේ ය: මෙතැන් සිට සදහට ම දාවිත් රජුගේ සිහසුනේ වැඩහිඳින එතුමන්ගේ රාජ්‍යය ස්ථිරව පිහිටුවන ලෙස එතුමාණෝ යුක්තියෙන් ද ධර්මිෂ්ඨකමින් ද රජකම් කරන සේක. සව් බලැති සමිඳුන්ගේ උද්යෝගයෙන් මෙය අධිෂ්ඨාන කළ සේක."

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 113: 1–8

පිළිතුර : සමිඳාණන්ගේ ශ්‍රී නාමයට සදා ප්‍රශංසා වේවා!

ගීය : සමිඳුන්ට ප්‍රශංසා කරන්න,
සමිඳුන්ගේ මෙහෙකරුවෙනි, ප්‍රශංසා කරන්න,
සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා කරන්න.
මෙතැන් පටන් සදහට සමිඳුන්ගේ නාමයට ප්‍රශංසා වේ වා!

සමිඳුන්ගේ නාමයට නැගෙනහිර පටන්
බස්නාහිර දක්වා ප්‍රශංසා කටයුතු ය.
සියලු ජාතීන්ට ඉහළින් සමිඳාණෝ වැජඹෙන සේක.
එතුමන්ගේ මහිමාලංකාරය අහස් තලය ඉක්මවා යයි.

අපේ දෙවි සමිඳුන්ට සමාන අන් කෙනෙක් නැත:
එතුමාණෝ උසස් තැන්හි වැඩ හිඳින සේක.
එහෙත්, අහසත්, පොළොවත් බලන පිණිස
එතුමාණෝ පහතට නැමෙන සේක.

එතුමාණෝ දුප්පතා ධූලියෙන් නැගිටුවන සේක:
දිළිඳා කසළ ගොඩින් ඔසවන සේක.
එසේ කරන්නේ, ඔවුන් අධිපතීන් සමඟ,
තම සෙනඟගේ අධිපතීන් සමඟ හිඳුවනු පිණිස ය.

## සුබපුවත් ජය නද ලූක් 1: 35

ආලේලූයා! ආලේලූයා!
“ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක:
පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසාගන්නේ ය.”
ආලේලූයා!

## සුවිශේෂය ලූක් 1 : 39−47

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

“ඔබ වනිතාවන් අතර අතිශයින් ආශීර්වාද ලද්දී ය.”

දින ගණනකට පසු මරිය තුමී නැඟිට, ජුදා කඳුකරයෙහි නුවරකට යුහු ව ගොස්, සෙකරියස්ගේ ගෙට ඇතුළු වී, එලිසබෙත් හට ආචාර කළා ය. එලිසබෙත් මරිය තුමියගේ ආචාර බස් ඇසූ කල ඇගේ කුසෙහි දරුවා ඉපිලෙන්නට වන. එවිට එලිසබෙත් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ ව, මහ හඬින් උදන් අනමින්, “ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දී ය. ඔබ කුස ඔත් දරු ඵලය ද ආශිර්වාද ලද්දේ ය. මාගේ සමිඳාණන් වහන්සේගේ මෑණියන් මා වෙත පැමිණීමට තරම් මම කවරෙක් ද? මක්නිසා ද ඔබේ ආචාර හඬ මා සවන් ගත වූ කෙණෙහි ම මා කුසෙහි දරුවා ප්‍රීතියෙන් ඉපිලී ගියේ ය. සමිඳාණන් වහන්සේගේ නාමයෙන් තමන් හට දුන් පොරොන්දුව ඉටුවන්නේ ම යයි විශ්වාස කළ තැනැත්තී භාග්‍යවන්තය” යි කීවා ය.

එවිට මරිය තුමී මෙසේ උදන් ඇනුවා ය.
“මාගේ හද සමිඳුන් උසස් ලෙස පසසයි, මාගේ ආත්මය මා මිදුම්කාර දෙවිඳුන් ගැන උදන් අනයි.”

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*

හෝ

## සුවිශේෂය ලූක් 1: 26–38

*සුවිශේෂක ලූක් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### "ඇය පිළිසිඳ පුතෙකු ලබන්නීය"

සවැනි මස, ගාබ්‍රියෙල් නම් දේව දූතයා දෙවියන් වහන්සේ විසින් ගලීලයේ නාසරෙත් නම් නුවර විසූ, දාවිත් රජ පරපුරෙන් පැවත එන ජෝසෙප් නම් මනුෂ්‍යයෙකු හට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යාවක වෙත යවන ලදි. ඒ කන්‍යාවගේ නම මරියා ය. දේව දූතයා, ඈ සිටි තැනට පැමිණ, "විපුල ප්‍රසාදලත් උත්තමිය,

ඔබට මංගල වේ: සමිඳාණන් වහන්සේ ඔබ සමග ය"යි කී ය. එහෙත්, ඈ ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැ යි සිත සිතා සිටියා ය. දේව දූතයා ඈට කතා කොට, "මරියාණෙනි, බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාදය ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය:

උන් වහන්සේට 'ජේසුස්' යන නාමය තබන්න. උන් වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක, පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක: උන් වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමීන් වහන්සේ උන් වහන්සේට ප්‍රදානය කරන සේක: උන් වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක: උන් වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය"යි කී ය.

එවිට මරිය තුමී දේව දූතයාට කතා කොට, "මට පුරුෂයකු නැති බැවින් මෙවැන්නක් කෙසේ විය හැකි දැ"යි ඇසුවා ය. දේව දූතයා ඈට උත්තර දෙමින්, "ශුද්ධාත්මයාණන් වහන්සේ ඔබ කෙරෙහි පහළ වන සේක: පරමෝත්තමයාණන්ගේ ආනුභාවය ද ඔබ වසාගන්නේ ය. එහෙයින් උපදින පරිශුද්ධ දරුවා 'දෙවියන් වහන්සේගේ පුත්‍රයාණෝ ය'යි කියනු ලබන සේක. බලන්න, ඔබේ ඥාතිවරිය වන එලිසබෙත් ඇගේ මහලු වයසේ දී පුතෙකු පිළිසිඳගත්තා ය. වඳ යයි කී ඇයට දැන් සවැනි මාසය ය. මක්නිසා ද, දෙවියන් වහන්සේට නොකළ හැකි කිසිවක් නැතැ"යි කීවේ ය. මරිය තුමී කතා කරමින්, "බලන්න, මම සමිඳාණන් වහන්සේගේ දාසිය වෙමි: ඔබ පැවසූ ලෙස ම මට ඉටු වේ වා"යි කීවා ය. එවිට දේව දූතයා ඈ කෙරෙන් වෙන් ව ගියේ ය.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*